ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
பொருளாதார அபிவிருத்தி அமைச்சு
Ministry of Economic Development

මගේ අංකය / எனது இல / My No: DDD/HO/04/LH/01

ඔබේ අංකය / உமது இல / Your No: ..................

# දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
tho t|dvOrr| mg|t|Uj j| j|i z f f s k
# Department of Divineguma Development

දිනය / திகதி / Date: 2014.06.17

24/4, කාසල් වීදිය, කොළඹ -8.
24/4, காசல் வீதி, கொழும்பு
24/4, Castle street , Colombo - 08.

---

**දිවිනැගුම චක්‍රලේඛ අංක - 2014 / 05**

දිවිනැගුම කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිවිනැගුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**දොරින් දොරට - ගමින් ගමට**

**<u>දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන - 2014</u>**

පුද්ගලයා, පවුල සහ කණ්ඩායම් කේන්ද්‍රගතවූ ජීවනෝපාය සංවර්ධනය හරහා ජාතික ආර්ථික සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන සැලසුම් කර ඇත.

මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ, පවුල් ඒකකය තුල වියදම අඩුකර ගැනීමත්, අමතර ආදායම් ලබාගැනීමේ සහ ප්‍රධාන ආදායම් මාර්ගයක් වශයෙන් ගෘහස්ථ මට්ටමින් කෘෂිකාර්මික, කාර්මික හෝ සේවා ක්ෂේත්‍රයන් තුලින් රැකියා අවස්ථා ඇතිකරලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි.

ඒ අනුව දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් වෙන් කරන ලද ප්‍රතිපාදන මේ වන විටත් කලාප කාර්යාල වෙත ලබාදී ඇත.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශිත ' 2014 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම පිළිබඳව අත්වැල ' හි සඳහන් උපදෙස් වලට අනුකූලව දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට වැඩිදුරටත් මඟ පෙන්වීමක් ලෙස මෙම උපදෙස් නිකුත් කරනු ලබන අතර ජාතික ආර්ථික සංවර්ධන සැලැස්මේ සංධිස්ථානයක් බවට පත් කර ගැනීමට ඔබ ඇතුළු අදාළ නිලධාරීන්ගේ ක්‍රියාකාරී දායකත්වය ඉතා වැදගත් වේ.

මේ අනුව පහත පරිදි ප්‍රධාන අංශ 04 ක් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ.

1. කෘෂි සංවර්ධන වැඩ සටහන
2. පශු සම්පත් සංවර්ධන වැඩ සටහන
3. ධීවර සංවර්ධන වැඩ සටහන
4. කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන

පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ඔබ කලාපයේ හා දිස්ත්‍රික්කයේ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම මැනවි.